# කොටි සමූලඝාතනයකරමු

අප මේ තේමාව යටතේ ලියන පළමුවැනි ලිපිය හෝ අවසාන ලිපිය මෙය නො වෙයි. යුදවාදියා, ජාතිවාදියා, අන්තවාදියා, දෙමළ විරෝධියා, යුදෙව් ක්‍රිස්තියානි විරෝධියා, නූතනත්ව විරෝධියා, ලෝකය ගැන නොදත් ලිංමැඩියා, අතීතකාමියා, ආදී දඟසක් නම් අප වෙත පටබැඳීමට හේතුභූත වූ ප්‍රධානම කරුණ දශක දෙකක පමණ කාලයක් තිස්සේ අප මේ තේමාව ඔස්සේ කතාකිරීම ය, ඒ පිළිබඳ ලිවීම ය. එකල අප හමුදා ක්‍රියා මාර්ගයකින් කොටි පරාජය කළයුතු බව කී විට බොහෝ දෙනා අප අදහසට එකඟ නො වූහ. එහෙත් අද ඒ සියළු දෙනාම පාහේ අප සමග එකඟවීම ගැන අපි සතුටු වෙමු. තවමත් එයට නිල වශයෙන් මෙන් ම පෞද්ගලිකව ද විරුද්ධ වන්නේ දෙමළ පක්ෂ, ඊනියා ජාත්‍යන්තර ප්‍රජාව, රාජ්‍ය නොවන සංවිධාන, ඇතැම් ආගමික නායකයන්, පල්ලි නිකායේ භික්ෂූන්, ජරාජීර්ණ වූ මාක්ස්වාදී පක්ෂ, ඊනියා පශ්චාත්මාක්ස්වාදීන්, පශ්චාත්නූතනවාදීන් ඇතුළු සකලවිධ පශ්චාත්තාපවාදීන් හා තම තමන් ප්‍රබුද්ධ යැයි කියාගන්නා ඇතැම් ජනමාධ්‍යවේදීන් හා ඊනියා මානවහිතවාදීන් කිහිප දෙනකු පමණ ය. සංවිධාන විශාල සංඛ්‍යාවක් ලෙස පෙණුන ද මොවුන් විසින් නියෝජනය කෙරෙන සිංහල ජනතාව විශාල නො වේ. ඉහත සඳහන් සංවිධාන හා පක්ෂවලින් දෙමළ පක්ෂයකට හැරෙන්නට වෙනත් කිසිම සංවිධානයකට හෝ පක්ෂයකට හෝ පාර්ලිමේන්තුවේ ඡන්දයෙන් පත්වූ එකදු මන්ත්‍රීවරයකුවත් නොමැති බව අවධාරණය කළ යුතු ය.

අද මෙරට ක්‍රියාවලීන් දෙකක් සිදුවෙමින් පවතියි. එකක් ඊනියා සාම ක්‍රියාවලියයි. අනෙක මරණ ක්‍රියාවලියයි. කොටි සංවිධානය තමන්ට රිසිසේ පුද්ගලයන් ඝාතනයකරයි. ආණ්ඩුව හා වෙනත් සංවිධාන ඒ හෙළාදකිමින් නිවේදන නිකුත්කරයි. එහි දී ඊනියා ජාත්‍යන්තර ප්‍රජාව ඇපයෙන් බේරීමට මෙන් ඝාතන පිළිබඳ තම ශෝකය පළකරයි. එහෙත් කොටි සංවිධානයට ඒ පිළිබඳ දොසක් නොකියයි. ඒ වෙනුවට ඔවුන් කියන්නේ දෙපැත්තම ඝාතනවලින් ඉවත්වී සාම ක්‍රියාවලිය ඉදිරියට ගෙන යා යුතු බව ය. අර ආගමික නායකයන් මෙහි දී බොහෝවිට මුනිවත රකිනු දැකිය හැකි ය. රාජ්‍ය නොවන සංවිධානවල (ව්‍යාපාරවල) කෙරුමන් ආණ්ඩුවෙන් සාමාන්‍ය පුරවැසියකු ඝාතනයවන තෙක් බලාසිටින්නේ ඊළඟ චෙක්පතට එමගින් පාර කැපෙන බැවිනි. ඒ ප්‍රකාශ නිකුත් වී ඒ ඝාතන අමතක වීමටත් පෙර කොටි තවත් පුද්ගලයකු හෝ පුද්ගලයන් හෝ ඝාතනයකරන්නේ මරණ ක්‍රියාවලිය දිගට ම කරගෙන යමිනි. ඊනියා සාම ක්‍රියාවලියේ ප්‍රධාන පැතිකඩ දෙකක් වෙයි. එකක් ආණ්ඩුව කොටි සංවිධානය සමග පමණක් සාකච්ඡාකිරීම ය. ඒ සාකච්ඡා ඊනියා ජාත්‍යන්තර ප්‍රජාවගේ මැදිහත්වීමෙන් සිදුවෙයි. අනෙක් පැතිකඩ ඊනියා ජනවාර්ගික ප්‍රශ්නයට විසඳුමක් සෙවීම ය. මේ විසඳුම බලය බෙදීම සම්බන්ධයෙන් වෙයි. ඒ සඳහා ව්‍යවස්ථා සංශෝධනයක් අවශ්‍ය බව ඇතැම්විට කියැවෙයි. එහි දී උතුරු හා නැගෙනහිර පළාත් ඒකාබද්ධකර බලය බෙදිය යුතු යැයි ද පළාත්වලට ඉන්දියාවේ ප්‍රාන්තවලට මෙන් බලතල තිබිය යුතු යැයි ද ඉන්දියාව තරයේ කියා සිටියි. මෙහි දී කිවයුතු කරුණක් වනුයේ සර්වපාක්ෂික නියෝජිත සම්මේලනයේ සියළු පක්ෂ බලය බෙදීමට එකඟ වී ඇති බව ය. එහෙත් බලය බෙදීම යන්නෙන් අදහස්කරන්නේ කුමක් ද, ඒකකය කුමක් ද, ඒ ඒකීය රාජ්‍යයක් තුළ සිදුවිය යුතු ද නැත්නම් සන්ධීය රාජ්‍යයක් තුළ සිදුවිය යුතු ද ආදී කරුණු සම්බන්ධයෙන් පමණක් නොව බලය බෙදන්නේ කිනම් ප්‍රශ්නයක් විසඳීම සම්බන්ධයෙන් ද යන්න ගැන පවා එකඟත්වයක් නැත. අඩුම තරමින් එක් පක්ෂයකට අනුව බලය බෙදන්නේ ඊනියා දෙමළ ප්‍රශ්නයක් විසඳීමට හෝ දෙමළ අභිලාෂ සපුරාලීම සඳහා හෝ නොව රටේ සංවර්ධනය හා පරිපාලනය උදෙසා ය. කෙසේ වෙතත් අද ඊනියා සාම ක්‍රියාවලියේ එක් පැතිකඩක් ලෙස බලය බෙදීම සම්බන්ධ සාකච්ඡාවක් සිදුවන බව පිළිගතයුතු ය.

මෙහි දී ඉන්දියාව ගැන නැවතත් යමක් සඳහන්නොකර සිටිය නො හැකි ය. ඉන්දියාව තම ආකෘතියට අනුව බලය බෙදන ලෙස ඉල්ලන්නේ දෙමළ ජනයා සිංහල ජනතාවට විරුද්ධව උසිගන්වා එමගින් අප රට දුර්වලකිරීමට ය. අද සාර්ක් කලාපයේ ඉන්දියාවට අවනත නැති රාජ්‍ය ලෙස පවතින්නේ ශ්‍රී ලංකාව හා පකිස්ථානය පමණකි. ඉන්දියාව මේ තත්වය නුරුස්සයි. ලංකාව ඉන්දියාවට මෙතරම් ආසන්නයේ පැවතිය ද ඉතිහාසයේ කිසිම කලක කිසිම භාරතීය වාංශික රාජ්‍යයකට (භාරතයේ බොහෝවිට පැවතී ඇත්තේ වාංශික රාජධානි මිස අඩුම තරමින් ජනවර්ගයක් මත පදනම් වූ රාජ්‍ය නො වෙයි.) ලංකාව මුළුමනින් ම යටත්කරගැනීමට නොහැකි වී ඇත. චෝල රාජ්‍යයට, එනම් චෝල වාංශික රාජ්‍යයට පවා රුහුණේ බොහෝ කොටස් යටත්කරගැනීමට නොහැකි විය. අද පවා ඉන්දියාවට ලංකාව තමන්ට අවශ්‍ය අන්දමට මෙහෙයවිය නො හැකි ය. ඊනියා ජාත්‍යන්තර ප්‍රජාවට මෙන් ම ඉන්දියාවට ද දෙමළ ජනයා

අවශ්‍ය වෙයි. ඒ බෙදා පාලනයකිරීම සඳහා ය. මෙහි දී පාලනය යනුවෙන් අදහස්කරන්නේ අවනතකරගැනීම ය. මෙරට දෙමළ ජාතිවාදී ප්‍රශ්නයක් ඇතිකළෝ ලන්දේසිහු හා බ්‍රිතානීහු ය. ඒ පිළිබඳ ව අප දීර්ඝ වශයෙන් ලියා ඇතිමුත් සිංහල ජනතාව තවමත් ඒ පිළිබඳ අවධානයක් නොකරති. සිංහලයන් ද තවමත් දෙමළ ජාතිවාදය පිළිබඳ ප්‍රශ්නයට අවතීර්ණවන්නේ 1947න් පසුව ය. එහෙත් ප්‍රශ්නයේ ආරම්භය ලන්දේසි යුගය දක්වා දිවයයි. සිංහලයන් ප්‍රශ්නයේ ආරම්භය හා විකාශය පිළිබඳව දෙමළ ජාතිවාදීන් බටහිරයන් හා එක්ව පතුරවන මතය පිළිගන්නා තෙක් සිංහලයන් සිටින්නේ දුර්වල ස්ථානයක බව අමතක නොකළ යුතු ය. ඒ කෙසේවෙතත් අද ඉන්දියාව එදා බ්‍රිතානිය කළාක් මෙන් සිංහල ජනයාට විරුද්ධව දෙමළ ජනයා උසිගන්වන බව පැහැදිළි විය යුතු ය. අප මත බලයෙන් පටවනු ලැබූ ඉන්දු ලංකා ගිවිසුමෙහි උතුරු හා නැගෙනහිර පළාත් දෙමළ ජනයාගේ ඊනියා ඓතිහාසික වාසභූමි යන කෙප්පය සඳහන්කර ඇත්තේ ඓතිහාසික සාධක ඇතිව නොව දේශපාලන අවශ්‍යතා සඳහා ය.

ඊනියා සාම ක්‍රියාවලියේ පැතිකඩ දෙක වෙන්කළ යුතු කාලය එළඹී ඇත. බලය බෙදීම ගැන අද සාකච්ඡා පවත්වන ඇතැමුන්ට අවශ්‍ය වී ඇත්තේ ඒ සාකච්ඡා ඔස්සේ ඉදිරිපත්වන යම් යෝජනාවක් වෙතොත් එය ඊනියා සාම ක්‍රියාවලියේ අනෙක් පැතිකඩවන ආණ්ඩුව කොටි සමග කරන සාකච්ඡා සඳහා ආණ්ඩුවේ ස්ථාවරය ලෙස ඉදිරිපත්කිරීම ය.  ඒ යෝජනා දෙමළ අභිලාෂ සපුරාලන බව ඊනියා ජාත්‍යන්තර ප්‍රජාව පිළිගතහොත් එමගින් කොටි දුර්වලවන බව ඇතැම්හු, විශේෂයෙන් ම ඇතැම් මාක්ස්වාදී පක්ෂවල නායකයෝ කියා සිටිති. එහෙත් ඒ කොටින්ට උඩගෙඩි දීමකි. විසඳුම කිනම් ප්‍රශ්නයක් අරභයා දුන්න ද කොටි එවිට සාකච්ඡාවට එළඹෙන්නේ ආණ්ඩුවේ ස්ථාවරයෙන් තවත් එහාට යෑමට ය. කොටින්ගේ ඉල්ලීම වෙනම රාජ්‍යයකි. කොටි තම ඉල්ලීමෙන් මේ පැත්තට ඒමට සූදානම් බව පෙන්වනු ඇත්තේ ආණ්ඩුව තම ස්ථාවරයෙන් ඒ පැත්තට යෑමට සූදානම් බව පෙන්වන්නේ නම් පමණකි. එවිට ආණ්ඩුවට සිදුවනු ඇත්තේ ඊනියා ජාත්‍යන්තර ප්‍රජාවගේ, එනම් බටහිර රාජ්‍ය කිහිපයක හා ජපානයේ, හා ඉන්දියාවේ බලපෑම යටතේ තව තවත් කොටි ඉල්ලන දේ දීමට ය. එහෙත් එහි කෙළවරක් නැතිවනු ඇත්තේ කොටි එයින් ද සෑහීමකට පත්නොවන බව ඉතිහාසයෙන් ඔප්පු වී ඇති බැවිනි. කොටි තම ඉලක්කය කරා යන තෙක් මරණ ක්‍රියාවලිය නතර නොකරනු ඇත. අප අමතක නොකළ යුතු තවත් කරුණක් නම් කොටි සංවිධානය ක්‍රියාත්මකවන තෙක් ඇතැම් දෙමළ පක්ෂ හා මාක්ස්වාදී පක්ෂ කොටි බිල්ලා පෙන්වමින් සිංහලත්වයට මෙරට හිමි තැන අහිමිකිරීමට කටයුතු කරන බව ය.

එබැවින් සාම ක්‍රියාවලියේ බලය බෙදීම සම්බන්ධ සාකච්ඡා කොටි සමග කරන සාකච්ඡාවලින් වෙන්කළ යුතු ය. බලය බෙදීම පිළිබඳ සාකච්ඡාකරන්නේ කිනම් ප්‍රශ්නයක් විසඳීම සම්බන්ධයෙන් ද යන්න පිළිබඳව ද එකඟතාවක් නොමැති විටක ඇතැමුන්ගේ අභිලාෂය අනුව ඒ දෙමළ අභිලාෂ සපුරාලීම සඳහා කරන සාකච්ඡාවක් බවට පත්කරලිය නොහැකි ය. බලය බෙදීම පිළිබඳ සාකච්ඡාව මෙරට සංවර්ධනය හා ජනතාවට පරිපාලනය මධ්‍යගතවීම නිසා ඇතිවන ප්‍රශ්න විසඳීම සඳහා කෙරෙන සාකච්ඡාවක් බවට පත්විය යුතු ය. එහි දී බලය බෙදන්නේ කිනම් ඒකකයකට ද යන්න ඒකීය රාජ්‍ය සංකල්පය තුළ සිදුවිය යුතු ය.  එමෙන් ම බලය බෙදීම ජනවාර්ගික පදනමකින් නොව භෞමික පදනමකින් සිදුවිය යුතු ය. එවැනි බලය බෙදීමකින් උතුරු පළාතේ දෙමළ ජනයාට ඒ පළාතේ සංවර්ධන කටයුතුවල දී විශාල වගකීමක් පැවරෙන බව ද අමතක නොකළ යුතු ය. ඉහත සඳහන් පරිදි සාම ක්‍රියාවලියේ බලය බෙදීම පිළිබඳ සාකච්ඡා කොටි සමග කරන සාකච්ඡාවලින් වෙන්කළ යුතු කාලය එළඹී ඇත. කොටි සමග සාකච්ඡාවක් අවශ්‍ය නැත. ඒ අවශ්‍ය ම යැයි යම් කිසිවකු පවසන්නේ නම් එය සම්බන්ධකළ යුත්තේ කොටින්ගේ මරණ ක්‍රියාවලිය සමග ය. අද කළ යුත්තේ කොටින්ගේ මරණ ක්‍රියාවලිය වහා නතර කිරීම ය. එහි දී කොටි සංවිධානය තහනම්කිරීම ද වැදගත්විය හැකි නමුත් ඒ ස්ථාවර තහනමක් නොවේ නම් ඉන් එතරම් ඵලයක් අත් නො වෙයි. මෙයට පෙර ද දළදා මාළිගාවට බෝම්බ ගැසීමෙන් පසුව කොටි සංවිධානය තහනම් කෙරිණි. එහෙත් පසුව ඊනියා සාකච්ඡා වෙනුවෙන් තහනම ඉවත්කෙරිණි. කොටි තහනම අරින වහන රේල් ගේට්ටුවක් මෙන් නොවිය යුතු ය. මේ සියල්ලෙන් සහ ඉතිහාසයෙන් පෙන්නුම්කරන්නේ අද මරණ ක්‍රියාවලිය හා සාම ක්‍රියාවලිය පැහැදිළිව බෙදිය යුතු බව ය. සාම ක්‍රියාවලිය දෙමළ ජනයාගේ ඊනියා අභිලාෂ සපුරාලීමට නොව සංවර්ධනය හා පරිපාලනය අරභයා ජනතාවගේ (දෙමල පමණක් නොව සිංහල,මුස්ලිම් සියල්ලන්ගේ) ප්‍රශ්න විසඳීම සම්බන්ධයෙන් විය යුතු ය. ඒ කරගෙන යන අතර මරණ ක්‍රියාවලිය වහා නතරකිරීමට කටයුතු කළ යුතු ය. ඒ කළ හැක්කේ කොටි සමූලඝාතනය කිරීමෙන් පමණකි.

**මහාචාර්ය නලින් ද සිල්වා**

© Prof. Nalin De Silva